ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2017

විෂය අංකය / பாட இலக்கம்: 25A    විෂය / பாடம்: ඉන්දියා ඉතිහාසය

පිළිතුරු හා
ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 2 | 21. | 5 | 31. | 2 |
| 02. | 4 | 12. | 5 | 22. | 1 | 32. | 1 |
| 03. | 5 | 13. | 3 | 23. | 2 | 33. | 4 |
| 04. | 4 | 14. | 4 | 24. | 2 | 34. | 4 |
| 05. | 1 | 15. | 3 | 25. | 3 | 35. | 5 |
| 06. | 5 | 16. | 2 | 26. | 4 | 36. | 2 |
| 07. | 1 | 17. | 4 | 27. | 5 | 37. | 3 |
| 08. | 3 | 18. | 5 | 28. | 1 | 38. | 1 |
| 09. | 2 | 19. | 3 | 29. | 4 | 39. | 1 |
| 10. | 4 | 20. | 1 | 30. | 3 | 40. | 2 |

○ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | |
|---|---|---|
| ඉතිහාසය II<br>வரலாறு II<br>History II | 25-A | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 1

විභාග අංකය / சுட்டெண் / Index No. ....................



AL/2017/25-A/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ட்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | |
|---|---|---|
| ඉතිහාසය | II | (II කොටස) |
| வரலாறு | II | (பகுதி II) |
| History | II | (Part II) |

25 - A | S | II

ඉන්දීය ඉතිහාසය - අත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා

උපදෙස්:
* පළමුවැනි ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.
(පළමුවැනි ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.)

## II කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් ස්ථාන 8 නිවැරදිව ලකුණු කොට නම් කරන්න. ඒවායින් ඕනෑම දෙකක් පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.
   - (i) තක්ෂිලා
   - (ii) හරප්පා
   - (iii) සාරානාත්
   - (iv) සාංචි
   - (v) වින්ධ්‍යා කඳුවැටිය
   - (vi) තංජෝර්
   - (vii) තාම්‍රලිප්ති
   - (viii) නර්මදා ගඟ

   *(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්; කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 03 බැගින්.)*

2. මොහෙන්ජොදාරෝ-හරප්පා ශිෂ්ටාචාරයේ සමාජ, සංස්කෘතික හා ආර්ථික තත්ත්වයන් පැහැදිලි කරන්න. (ලකුණු 14යි.)

3. බ්‍රහ්මාවර්තයේ සිට ආර්යාවර්තයට ජනාවාස ව්‍යාප්ත වීමත් සමග සමාජ හා සංස්කෘතික අංශවල ඇති වූ වෙනස්කම් පරීක්ෂා කරන්න. (ලකුණු 14යි.)

4. මෞර්ය පාලන ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 14යි.)

5. "කනිෂ්ක රජු කුෂාණ රාජ වංශයේ කැපීපෙනෙන නායකයා විය."
   - (i) කනිෂ්කගේ අගනුවර කුමක් ද? (ලකුණු 01යි.)
   - (ii) කුෂාණ සමයේ සිටි ප්‍රධාන පෙළේ බෞද්ධ භික්ෂූන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02යි.)
   - (iii) ඉන්දියානු දේශපාලන ක්ෂේත්‍රයෙහිලා කුෂාණයන්ගේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 03යි.)
   - (iv) "සංස්කෘතික හා ආගමික ක්ෂේත්‍රවල වර්ධනයට කනිෂ්ක රජුගෙන් සිදු වූ දායකත්වය කැපීපෙනේ." මෙම ප්‍රකාශය පරීක්ෂා කරන්න. (ලකුණු 08යි.)

6. ගුප්ත අධිරාජ්‍යය පිහිටීමට හා බිඳවැටීමට බලපෑ ප්‍රධාන සාධක කවරේ ද? (ලකුණු 14යි.)

7. "ගුප්තයන්ගෙන් පසු උතුරු ඉන්දියාව ප්‍රමුඛත්වයට පැමිණියේ හර්ෂවර්ධන රාජ්‍ය සමයේ දී ය."
   - (i) හර්ෂවර්ධන රාජ්‍ය කාලය පිළිබඳ දැක්වෙන සාහිත්‍ය මූලාශ්‍රයක් නම් කරන්න. (ලකුණු 01යි.)
   - (ii) ඔහුගේ රාජ්‍ය සමයේ දී බෞද්ධ සම්මේලන පැවැත්වූ ප්‍රධාන ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02යි.)
   - (iii) ඔහු කනෞජයේ සිංහාසනයට පැමිණි ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03යි.)
   - (iv) උතුරු ඉන්දියානු ආධිපත්‍යයේ මධ්‍යස්ථානය බවට කනෞජය පත්කිරීමෙහිලා හර්ෂවර්ධනගේ දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 08යි.)

8. එක්කෝ (A) කොටසට නැතහොත් (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.
   - (A) ක්‍රි. ව. 7 හා 8 වන සිය වර්ෂවල දී බටහිර සහ වයඹදිග ඉන්දියාවට එල්ල වූ අරාබි ආක්‍රමණ විචාරාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 14යි.)
   - (B) පල්ලව රාජ්‍යයේ සහ පල්ලව රාජවංශය යටතේ වෙළඳ බල ව්‍යාප්තියේ ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න. (ලකුණු 14යි.)

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ සටහන් ලියන්න.
   - (i) සෙලියුකස් නිකේටර්
   - (ii) ශක රාජ්‍ය
   - (iii) සංගම් සාහිත්‍යය
   - (iv) වයඹදිග ඉන්දියාවේ ශක පාලනය

   *(එක් සටහනකට ලකුණු 07 බැගින්.)*

* * *

All Rights Reserved

Sri Lanka Department of Examinations

General Certificate of Education (Adv. Level) Examination

| | | | |
|---|---|---|---|
| ඉතිහාසය II<br>வரலாறு II<br>History II | 25-A | S | ඉන්දියා ඉතිහාසය |

| | | | |
|---|---|---|---|
| ප්‍රශ්න අංකය<br>வினா இல.<br>Question No. | 1 | ප්‍රශ්න හා පිළිතුරු | විභාග අංකය<br>சுட்டெண்<br>Index No. ................................ |



## II කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් ස්ථාන 8 ලකුණු කොට නම් කරන්න. එවායින් ඕනෑම පහක් පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

| | |
|---|---|
| (i) [illegible] | (ii) හරප්පා |
| (iii) [illegible] | (iv) සාංචි |
| (v) [illegible] | (vi) [illegible] |
| (vii) [illegible] | (viii) [illegible] ගඟ |

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්, කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගින්)

2. මොහෙන්ජොදාරෝ - හරප්පා ශිෂ්ටාචාරයේ සමාජ, සංස්කෘතික හා ආර්ථික තත්ත්වයන් පැහැදිලි කරන්න.

- හරප්පා සභ්‍යත්වයේ පැවැති සමාජ, ආර්ථික තත්ත්වයන් පුරාවිද්‍යාත්මක සාක්ෂි මත තහවුරු කර ගත හැකිය.
- ආදි ඔස්ට්‍රොලොයිඩ්, මධ්‍යධරණී, මොංගොලියානු හා ඇල්පයින් ජන මිශ්‍රණයකින් යුතු මිශ්‍ර ප්‍රජාවක් සිටීම.
- මාතෘමූල සමාජයක් පැවැතීම.
- පන්ති භේදයක් දක ගත හැකි වීම.
- නාගරික, ග්‍රාමීය, කම්කරු කොටස්වලින් යුත් සමාජ ව්‍යුහයක් හඳුනාගත හැකි වීම.
- පූජක හා ප්‍රභූ පිරිස් පාලනය මෙහෙයවූ බව අනුමාන කළ හැකිය.
- සමාජ තරාතිරම අනුව ජීවන රටා හැඩගැසී තිබීම.
- මහල් නිවාස, කුඩා නිවාස හා කම්කරු නිවාසවල ජීවත්වූ ඔවුන් සිය ආදායම් තත්ත්වයන්ට අනුව ආභරණ පැළඳි බව පැහැදිලි වේ.
- ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම ආභරණ පැළඳීම.
- විශේෂිත සංස්කෘතික අංගයක් ලෙස ආගමික පුද පූජා පැවැත් වූ බව මුද්‍රා මගින් තහවුරු කර ගත හැකිය.
- පුද්ගලයන් මිය ගිය පසු මිහිදන් කිරීම, සොහොන් බිම් හමුවී තිබීම.
- කෘෂිකර්මය, අභ්‍යන්තර වෙළඳාම, විදේශ වෙළඳාම, කර්මාන්ත හා සත්ව පාලනය මත ආර්ථිකය පදනම් වී තිබීම.
- තිරිඟු, යව, බාර්ලි, කපු වැනි භෝග වගා කර තිබීම.
- හරප්පා මහා ධාන්‍යාගාරය පිළිබඳ තොරතුරු හමුවී තිබීම.
- කෘෂිකාර්මික කටයුතු සඳහා ජල සම්පාදනයක් යොදාගෙන තිබීම.
- ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක් පැවතීම, විශාල නාගරික ජනගහනයක් නඩත්තු කිරීමට හැකි ශක්තිමත් ආර්ථිකයක් පැවැතීම.
- අභ්‍යන්තර වෙළඳාමේ දී ධාන්‍ය වර්ග, කපු රෙදි, රන් රිදී ලෝහ හා විසිතුරු ආභරණ වෙළඳ භාණ්ඩ අතරට එක් විය.
- හරප්පා සහ මොහෙන්ජොදාරෝ වෙළඳ නගර දෙකක් ලෙසට පැවැති බව මහා වීථි පද්ධතිය මගින් තහවුරු කර ගත හැකිය.
- ලෝතාල් වරාය මුල් කරගෙන විදේශ වෙළඳාම පැවැති බව සාක්ෂි මගින් සනාථ වේ.
- සුමේරියානු ශිෂ්ටාචාරය සමඟ ද වෙළඳ සබඳතා පවත්වාගෙන යන්නට ඇත.
- ගඩොල් කර්මාන්තය, රෙද්ද කර්මාන්තය, ලෝහ කර්මාන්තය, ඇත්දත් කර්මාන්තය, කලා නිර්මාණ ශිල්පය, රන් රිදී ආභරණ තැනීම වැනි කර්මාන්ත පවත්වාගෙන ගිය බවට පුරාවිද්‍යාත්මක සාක්ෂි ලැබී ඇත.
- මව් දෙවඟන හා පුරුෂ දෙවියන් පිදීම මෙන්ම ජල වන්දනාව, වෘක්ෂ වන්දනාව, සත්ව වන්දනාව පැවතීම.
- රූපාක්ෂර ක්‍රමය භාවිතය.

(ලකුණු 14 යි)

3. බ්‍රහ්මාවර්තයේ සිට ආර්යාවර්තයට ජනාවාස ව්‍යාප්ත වීමත් සමග සමාජ හා සංස්කෘතික අංශවල ඇති වූ වෙනස්කම් පරීක්ෂා කරන්න.

- බ්‍රහ්මාවර්තයේ සිට ආර්යාවර්තයට ජනාවාස ව්‍යාප්ත වීම හඳුනා ගැනීම (ඍග් වෛදික යුගයේ සිට පශ්චාත් වෛදික යුගය තෙක්).
- ඍග්වේදයෙන් අනාවරණය වන කාලය ඍග්වෛදික යුගය ලෙසත් යජුර්, සාම, අථර්වන්, බ්‍රාහ්මණ, ආරණ්‍යය හා උපනිෂද්වලින් හෙළිවන යුගය පශ්චාත් වෛදික යුගය ලෙසත් සැලකේ.
- ගෝත්‍රික හා ග්‍රාමීය ලක්ෂණවලින් යුක්ත වූ ඍග්වෛදික යුගය භරත, යදු, තුර්වාස, පුරු ආදී ගෝත්‍ර ගණනාවක් දැකිය හැකිය. ගෝත්‍ර නායකයා රාජන් නම් විය.
- පවුලේ ප්‍රධානියා පියා වූ බැවින් වෛදික යුගය පීතෘමූල සමාජයක් විය. පශ්චාත් වෛදික යුගයේ දී ගෝත්‍රික සමාජයේ සිට තරමක් ස්ථාවර සමාජයක් කරා ගමන් කිරීමත්, රාජත්වය බිහිවීමත් දැකිය හැකිය.
- වෛදික යුගයේ කුල භේදයක් දක්නට නොමැති වුවද ආර්ය-අනාර්ය භේදය එකල පැවතිණි. පශ්චාත් වෛදික යුගයේ බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය හා ශුද්‍ර යනුවෙන් ප්‍රධාන කුල හතරකට සමාජය බෙදුන අතර සංකීර්ණ කුලක්‍රමයක් දක්වා එය වර්ධනය වීම.
- එම කුලවලට නිශ්චිත කාර්ය කොටසක් පැවරුන අතර ආශ්‍රමධර්ම, ස්වධර්ම, ආචද් ධර්ම ක්‍රියාත්මක වීම.
- ඍග් වෛදික යුගයේ කාන්තාව තරමක් නිදහස් වුවද පශ්චාත් වෛදික යුගයේ කාන්තාවගේ සමාජ තත්වය පිරිහී තිබීම.
- කිරි, ගිතෙල්, පළතුරු, තිරිඟු, බාර්ලි, ධාන්‍ය වර්ග මෙන්ම මස්, මාංශ වෛදික යුගයේ භාවිත කරන ලද අතර පශ්චාත් වෛදික යුගයේ ඉහත ආහාරවලට මුල් තැනක් ලැබුණ අතර යාගහෝම හා සෝමපානයට මුල් තැනක් හිමි වීම.
- කපු හා ලොම් රෙදි භාවිත වූ අතර ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂය එකිනෙකට වෙනස් ඇඳුම් භාවිත කිරීම හා දෙපක්ෂයම ආභරණ පැළඳීම.
- කෘෂිකර්මය, වෙළඳාම හා සත්ව පාලනය ආර්ථිකය තුළ බෙහෙවින් වැදගත් වීම සහ විවිධ ක්ෂේත්‍ර පදනම් කරගත් ගෘහ කර්මාන්ත පැවතීම.
- ඍග්වෛදික යුගයේ ස්වභාවික වස්තු දේවත්වයෙහිලා පුදනු ලැබීය. ඉන්ද්‍ර, වරුණ, මරුත්, අග්නි ඒ අතුරු කැපී පෙනුණි. පශ්චාත් වෛදික යුගයේ බහුදේවවාදී ආගමික සංකල්පය ඒකදේවවාදී සංකල්පයන් කරා නැඹුරු විය. වෛදික යුගයේ සරල යාගවිධි මෙකල සංකීර්ණ විය. බ්‍රාහ්මණයන්ගේ සමාජ තත්ත්වය ඉහළ ගියේය.
- විනෝදාංශ අතර ගායනය, නැටීම, සංගීතය හා ද්‍යූතකෙළිය මෙන්ම රිය ධාවනය ද පැවතීම.

  ලෝකය, විශ්වය, ජීවිතය, ආත්මය, මරණය, මරණින් මතු ආත්මය වැනි කාරණා පිළිබඳව ගැඹුරු දාර්ශනික කතිකාවන් ඉස්මතුවීම, ඒවා සාකච්ඡාවට බඳුන් කිරීම හා ඒ පිළිබඳ වාද විවාද පැවැත්වීම.
- ආරණ්‍යක හා උපනිෂද් වැනි යුගයන් කරා ළඟාවන්ම බ්‍රාහ්මණ සංකල්පයන්ට විරුද්ධව ශ්‍රමණ සම්ප්‍රදායයන් ඉදිරියට ඒම.
- ඍග්වෛදික යුගයට වඩා පශ්චාත් වෛදික යුගය තුළ විධිමත් අධ්‍යාපනයක් දක්නට ලැබීම. (ලකුණු 14 යි)

**4. මෞර්ය පාලන ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ සාකච්ඡා කරන්න.**

මෞර්ය අධිරාජ්‍යය ඉන්දියාවේ ප්‍රථම අධිරාජ්‍යය ලෙස සැලකේ. පාටලීපුත්‍ර නගරය කේන්ද්‍ර කරගත් මෞර්ය අධිරාජ්‍යය චන්ද්‍රගුප්ත, බින්දුසාර සහ අශෝක යන පාලකයන් යටතේ වර්ධනය විය.

මෞර්ය පාලන ක්‍රමය පිළිබඳව තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර කිහිපයකි: කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රය, විශාකාදත්තගේ මුද්‍රා රාක්ෂය, පතාංජලීගේ මහාභාෂ්‍යය, භද්‍රබාහුගේ කල්ප සූත්‍රය, දිව්‍යාවදානය, මෙගස්තිනිස්ගේ ඉන්ඩිකා ග්‍රන්ථය, අශෝක සෙල්ලිපි.

මූලාශ්‍රගත තොරතුරුවලට අනුව මෞර්ය පාලන ක්‍රමය කොටස් දෙකකට වෙන් කළ හැකිය:

1. මධ්‍යම පාලනය  2. ප්‍රාදේශීය පාලනය

**මධ්‍යම පාලනය**

මධ්‍යම පාලනයේ ඉහළ නිලධාරියා රජුය. රාජත්වය පාරම්පරිකව පියාගෙන් පුතාට හිමි විය. රජුට ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන සියලු බලතල හිමි විය. ඉන්දියාවේ ප්‍රථම වරට මහා අධිරාජ්‍යයක් හමුවන්නේ මේ කාලය තුළයි.

රජුට අසීමිත බලයක් පැවතීම, නීති පැනවීම, නීති ක්‍රියාත්මක කිරීම, ප්‍රචාරය කිරීම, කඩ කරන අයට දඬුවම් දීම, රාජ්‍ය අනුශාසනා පැවැත්වීම, අයවැය පිළිබඳ සොයා බැලීම, විදේශ සමඟ සබඳතා පැවැත්වීම, උසස් නිලධාරීන් පත් කිරීම යන ලක්ෂණ දැකිය හැකි විය.

<u>රජුට සහාය වූ නිලධාරීන්</u>

- රජු ළඟට සිටි ප්‍රධානතම නිලධාරියා උපරාජ විය. රජුගේ පුතා බොහෝ විට මේ තනතුර දැරීය.
- උපරාජයාට පහළ නිලධාරීන් රැසක් සිටීම. අභිලේඛනවල පුරුෂ යන නමින් ඔවුන් හඳුන්වාදීම. නිලධාරීන් කොටස් 3 කි:

  1. ඉහළ ශ්‍රේණියේ නිලධාරීන්
  2. මධ්‍යම ශ්‍රේණියේ නිලධාරීන්
  3. පහළ ශ්‍රේණියේ නිලධාරීන්

- මෞර්ය පාලනයට උපදේශක සභාවක් ද සහාය වී ඇත. අභිලේඛනවල පරිෂා යන වචනයද, නමින් ද අර්ථ ශාස්ත්‍රයේ පරිෂද් යන වචනය ද ඊට භාවිත වීම.
- මේ සභාව සාමාජිකයන් 12 ට නොඅඩු හා 20 ට නොවැඩි වීම හා රජුගේ කැමැත්ත මත සාමාජික සංඛ්‍යාව තීරණය වීම.
- ඉහළ ශ්‍රේණියේ නිලධාරීන් තිදෙනෙකි: පුරෝහිත, අග්‍රාමාත්‍ය, සේනාපති. මෞර්ය පාලනය තුළ කෞටිල්‍ය, පුරෝහිත හා අග්‍රාමාත්‍ය යන තනතුරු දෙකම ඉසිලීය.

- සේනාපති: අභ්‍යන්තර හා බාහිර තර්ජනවලින් රට ආරක්ෂා කිරීම, චතුරංගනී සේනාව පවත්වා ගැනීම, සේනාවට නායකත්වය දීම, සාමය පවත්වාගෙන යාම සිදු කිරීම.
- මධ්‍යම ගණයේ නිලධාරීන් 6 දෙනෙකි: අන්තඃපුර පාලක, භාණ්ඩාගාරික, මුදල් අයකැමි, බලකොටුභාර නිලධාරී, නගර අධ්‍යක්ෂක, රාජ්‍ය සීමා ආරක්ෂක.
- පහළ ගණයේ නිලධාරීන්: වන සම්පත්, කිරුම් මිනුම්, ස්වර්ණාභරණ, කෘෂිකර්ම, ඇත්, අස්, රිය, පාබල වැනි අමාත්‍යාංශ සම්බන්ධ නිලධාරීන්.
- යුක්ත, දූත, ලේඛක, මහාමාත්‍ර, ප්‍රතිවේදක (පටිවේදක) වශයෙන් තවත් නිලධාරීන් කොටසක් සිටීම.

**යුක්ත** (වසර 5 කට වරක් රට පුරා සංචාරය කර රජුගේ නියෝග ක්‍රියාත්මක කිරීම), **ලේඛක** (ලිපි ලේඛන භාරවීම), **දූත** (රජයේ නියෝග වෙනත් ප්‍රදේශවලට ගෙනයාම), **මහාමාත්‍ර** (අශෝක රජු අභිෂේකයෙන් 14 වැනි වර්ෂයේ මේ අය පත් කළේය. මෙහි අංශ 2 කි. ස්ත්‍රී අධ්‍යක්ෂක හා ධර්ම අධ්‍යක්ෂක වශයෙනි. මොවුන් විනිසුරුවන් හා අනුශාසකයන් ලෙස කටයුතු කිරීම), **ප්‍රතිවේදක** (වරපුරුෂයන්ගේ කටයුතු කිරීම, විවිධ වෙස් ගැනීම).

- කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රයේ දක්වන ආකාරයට ඇත්, අස්, රිය, පාබල, නාවුක, බඩුබාහිරාදිය ගෙන යන වශයෙන් හමුදාවන් සිටීම.

**ප්‍රාදේශීය පාලනය**

- මෞර්ය අධිරාජ්‍යයේ විශාලත්වය නිසා කොටස් 5 කට බෙදා පාලනය කිරීම.
- පාටලීපුත්‍රය (ප්‍රාච්‍ය)
  තක්ෂිලා (ගන්ධාරය)
  උජ්ජෙනිය (අවන්තිය)
  ස්වර්ණගිරිය (දක්ෂිණාපතය)
  තෝසල් (කාලිංගය)
- ප්‍රධානියා නගරාධිපති වීම. කෞටිල්‍ය විසින් නගරාධිපති "නගරක" නමින් හැඳින්වීම. සහායට ස්ථානික, ගෝප නිලධාරීන් සිටීම.
- මෙගස්තිනීස්ට අනුව පාටලීපුත්‍ර නගරයේ පාලනය නිලධාරීන් 5 දෙනෙකු යටතේ වූ මණ්ඩල 6 ක් මගින් ක්‍රියාත්මක විය: කර්මාන්ත, විදේශ කටයුතු, නිෂ්පාදන, ආදායම්, උපත් හා මරණ, වෙළඳ අංශ.
- පහළම පාලන ඒකකය ගම විය. එහි ප්‍රධානියා ග්‍රාමිණී විය

පාලනයේ දී රාජ්‍ය ආදායම් මාර්ග පිළිබඳව ද අවධානය යොමු විය. ගණිකා වෘත්තියෙන්, සූදු පිටිවලින් හා, මත්පැන්හල්වලින් ආදායම් ලබා ගැනීම, භාග, බලි, බදු, ආදායමෙන් පුනසාධනය, රාජ්‍ය නිලධාරීන්ට වැටුප් ගෙවීම, රජගෙදර නඩත්තුව, ධර්ම ප්‍රචාරක කටයුතු සිදු කිරීම.

**අධිකරණය**

- සාධාරණ අධිකරණයක් පැවතීම. ඉහළ අධිකරණය රාජාධිකරණයයි. රජු ප්‍රධාන විය. පහළ උසාවිවල දෙන ලද තීන්දු තීරණ සාධාරණ නොවේ නම් රාජාධිකරණයට අභියාචනා ඉදිරිපත් කිරීමට රටවැසියාට අයිතියක් තිබුණි.
- කෞටිල්‍ය අර්ථශාස්ත්‍රයට අනුව සෑම රාෂ්ට්‍රයකටම සෑම ද්‍රෝණි මුඛයකටම අධිකරණ ශාලා තිබිය යුතු විය.
- අධිකරණ ප්‍රධානියා ව්‍යවහාරික ලෙස නම් කිරීම. අධිකරණයේ පහළම උසාවිය තුළ ග්‍රාමක නම් නිලයක් පැවතීම. අශෝක රජු මරණයට නියම වූවන්ට දින 3 ක පොදු සමා කාලයක් ලබා දීම ගැන සෙල් ලිපිවල සඳහන් වීම.
- අධිකරණ ක්‍රියාවලිය මෙහෙයවීමේ බලය පාලකයා සතු වගකීමක් වීම.
- සොරකම, කුමන්ත්‍රණ, මංපැහැරීම, මහණ බමුණන්ට නොසැලකීම දඬුවම් ලැබිය හැකි වැරදි සේ සැලකීම.
- ඉහළ දඬුවම මරණීය දණ්ඩනය විය. ස්ත්‍රී-පුරුෂයන් වෙන් වෙන්ව සිරගත කිරීම.
- රජුගේ උපන් දිනය, රාජපද ප්‍රාප්තිය, පොහොය දින මුල්කරගෙන සිරකරුවන්ට සමාව දීම.

(ලකුණු 14 යි)

**5. "කනිෂ්ක රජු කුෂාණ රාජ වංශයේ කැපී පෙනෙන නායකයා විය".**

**(i) කනිෂ්ක රජුගේ අගනුවර කුමක්ද?**

පුරුෂපුරය (පෙෂාවර්) (ලකුණු 01 යි)

**(ii) කුෂාණ යුගයේ සිටි බෞද්ධ භික්ෂූන් දෙනමක් නම් කරන්න.**

අශ්වඝෝෂ/ නාගර්ජුන/ වසුමිත්‍ර/ වසුබන්ධු/ සංඝමිත්‍ර/ පාර්ශ්ව/ සූර්යබන්ධු/ ජිනබන්ධු/ සංඝරක්ෂිත (ලකුණු 02 යි)

**(iii) ඉන්දියානු දේශපාලන ක්ෂේත්‍රයෙහිලා කුෂාණයන්ගේ වැදගත්කම පැහැදිලි කරන්න.**

- කුෂාණයන්ගේ මුල් බිම චීන තුර්කිස්ථානයයි.
- යූ.ඒ.චී. ගෝත්‍රයට අයත් කුෂාණවරු ක්‍රිස්තු පූර්ව 140-120 අතර කාලයේ වයඹදිග දුර්ග මාර්ග ඔස්සේ ඉන්දියාවට පැමිණියහ.
- මෞර්ය අධිරාජ්‍යය බිඳ වැටීමෙන් පසු ඇති වූ දේශපාලන අස්ථාවරත්වය මත උතුරු ඉන්දියාවේ අධිරාජ්‍යයක් ගොඩනගන ලද්දේ කුෂාණවරුන් විසිනි.
- ක්‍රි.ව. 65 දී පමණ ගොන්ඩොපර්නීස් නම් පාර්තීය රජු පරදවා කාබුල් දක්වා බලය ව්‍යාප්ත කළේ ප්‍රථම කුෂාණ වංශික කුජුල කැඩ්ෆයිසස් විසිනි.
- විමා කැඩ්ෆයිසස් දෙවන කුෂාණ පාලකයාය. ඔහු කන්දහාර් තක්ෂිලා පසු කොට මථුරා දක්වා බලය ව්‍යාප්ත කළේය. සර්වලෝක ඊශ්වර මහේශ්වර යන විරුදය දැරූ ඔහු චීනය හා රෝමය සමඟ සබඳතා පැවැත්විය.
- කුෂාණ වංශයේ ශ්‍රේෂ්ඨතම පාලකයා කනිෂ්ක රජුය. ක්‍රි.ව. 78 දී පුරුෂපුරය අගනුවර කරගෙන බලය ව්‍යාප්ත කළ මොහු පිළිබඳව කාසි හා අභිලේඛනවල තොරතුරු ඇතුළත් වේ.

- කණිෂ්ක මරණැස දක්වා බලය ව්‍යාප්ත කළ බව සාරානාත් අභිලේඛනයේ සඳහන් වේ.
- සාංචි ලිපිය අනුව මාල්වා ද හියුං ත්සාං වාර්තා අනුව කාශ්මීරය ද විශෙට් ලේඛන අනුව සාකේතය ද දක්වා බලය ව්‍යාප්ත කළ මොහු අනතුරුව පාටලීපුත්‍රය ද ජය ගත්තේය.
- ඔරිස්සා, බිහාරය, නේපාලය ද යටත් කළේය.
- සූත්‍රාලංකාරයේ දක්වෙන්නේ නැගෙනහිර ඉන්දියාව ද යටත් කළ බවයි. ඒ අනුව බෙංගාලයේ ද බලය ව්‍යාප්ත කළ බව පැහැදිලි වේ.
- තවදුරටත් උත්තර ප්‍රදේශ, වයඹදිග ප්‍රදේශ, පංජාබය, සින්ද්, රාජ්පුතානා සහ කතියවාර් ප්‍රදේශ ද යටත් කළේය.
- හියුං ත්සාං වාර්තාවල දක්වෙන්නේ හොවැංහෝ නදී නිම්න ප්‍රදේශයෙන් සිරකරුවන් රැගෙන ආ බවයි.
- මනික්යාල, සෙඩා සෙල්ලිපි අනුව කණිෂ්කට සමකාලීනව වයඹදිග ප්‍රදේශවල ශකවරු සිටි බව පෙනේ.
- පෙරිප්ලස් ග්‍රන්ථයේ දක්වෙන්නේ බටහිර ඉන්දීය ප්‍රදේශ කණිෂ්ක යටතේ තිබූ බවයි. සන්දනෙස් යනුවෙන් කණිෂ්ක හඳුන්වා ඇත. ඔහු කතියවාර් භාරුකච්ච ද යටත් කළේය.
- ඒ අනුව කුෂාණවරුන් ඉන්දියාවේ විශාල ප්‍රදේශයක් යටත් කොට මධ්‍ය ආසියාව දක්වා බලය ව්‍යාප්ත කර තිබිණි.
- පංචාඕ නම් චීන සෙන්පතියාගේ ආක්‍රමණවලට ද කුෂාණවරුන් මුහුණදුන් බව සඳහන් වේ.
- කෂ්ගාර්, ඛෝමාන්, යාර්කාන්ඩ් ප්‍රදේශ දක්වා ද බලය පැතිරවූ බව සඳහන් වේ.

ඛෝමාන් (ලකුණු 03 යි)

(iv) **"සංස්කෘතික ආගමික ක්ෂේත්‍රවල වර්ධනයට කණිෂ්ක රජුගෙන් සිදු වූ දායකත්වය කැපී පෙනේ" මෙම ප්‍රකාශය පරීක්ෂා කරන්න.**

- විදේශීය රාජ වංශයකට අයත් වූවකු වුවද කණිෂ්ක රජු ඉන්දීය සංස්කෘතිය කෙරෙහි අනුග්‍රහය දැක්වීම.
- ප්‍රධාන වශයෙන් හතරවන ධර්ම සංගායනාව පැවැත්වීම වැදගත් වේ. භික්ෂූන් 500 කගේ සහභාගිත්වයෙන් වසුමිත්‍ර හිමියන්ගේ ප්‍රධානත්වයෙන් කාශ්මීරයේ කුණ්ඩල වන විහාරයේ දී එය පැවැත්වීම.
- එය ජලන්ධාරයේ පැවැත්වූ බවට මතයක් ඇත.
- බෝධිසත්ත්ව සංකල්පය (බෝධිසත්ත්ව යානය හෙවත් සෑම බැතිමතෙකුටම බෝධිසත්වයකු විය හැකිය යන සංකල්පය) ප්‍රචලිත වීම.
- දේව වන්දනාව / මන්ත්‍ර බලයෙන් විමුක්තිය ලැබීම වැනි දෑ මෙකල ප්‍රචලිත වීම.
- ආගම් ප්‍රචාරය සඳහා උගතුන්ගේ සහාය ලැබීම. ධර්ම දූත සේවා ක්‍රියාත්මක විය.
- සංස්කෘත භාෂාවේ වර්ධනයක් ඇති වීම.
- මහායාන පැවිදි පඬිවරුන් මෙකල බිහි වීම (වසුබන්ධු, වසුමිත්‍ර, පාර්ශ්ව, නාගර්ජුන, අශ්වඝෝෂ සංඝරක්ඛිත වැනි පඬිවරු).
- බුද්ධ ප්‍රතිමා ප්‍රථම වරට මානවරූපීව නිර්මාණය වීම.
- බෞද්ධ ගොඩනැගිලි විහාර ආරාම ස්තූප ඉදිවීම (කපිස නම් ස්ථානයේ තිබී හමු වූ ස්තූපය).
- පෙෂාවෝර්හි ශාන්තිඩෙරි නම් ස්ථානයේ පිහිටි මහල් ගණනාවකින් යුක්ත ධාතු මන්දිරයෙන් හමු වූ අඟල් 8 ක් උසැති තඹ ආලේපිත කරඬුව.

- මෙම ධාතු මන්දිරය අගසිලවුස් නම් ග්‍රීක ගෘහ නිර්මාණ ශිල්පියා විසින් කරවන ලද්දකි. දේවපාල රජුගේ නොශ්රාවත් සෙල්ලිපියේ සඳහන් තොරතුරු අනුව 7 සියවස දක්වාම එය පැවතිණි.
- බුද්ධ චරිතය, සූත්‍රාලංකාරය, ශාරිපුත්‍ර ප්‍රකරණය, සෞන්දරානන්දය වැනි ග්‍රන්ථ මෙකල රචනා වීම.
- ශක රාජවංශය ආරම්භ වීම.
- අච්චුකාසි භාවිතය ඇරඹීම (බුද්ධ රූපය සහිත කාසි)
- ගන්ධාර, මථුරා කලා සම්ප්‍රදායන් ඇරඹීම. ග්‍රීක පාර්සියන් කලාවේ බලපෑම.
- ඉන්දීය සංස්කෘතිය, ඉන්දියාවෙන් බැහැරට ව්‍යාප්ත වීම (චීනය දක්වා)
- මහායාන ත්‍රිපිටකය මහා විභාෂා නමින් සංස්කෘත භාෂාවෙන් තඹ පත්වල ලිවීම.
- මධ්‍ය ආසියාවේ යාර්ඛාන්ඩ්, කෝෂාන්, නීය වැනි ස්ථානවල බෞද්ධ මධ්‍යස්ථාන බිහිවීම.
- මහායාන බුදු දහමේ වර්ධනය
- සංස්කෘත භාෂාවේ වර්ධනය

ඉහත කරුණු අනුව කණිෂ්ක රජු කුෂාන් රාජවංශයේ කැපී පෙනෙන පාලකයා බව සනාථ වේ.

(ලකුණු 08 යි)

6. ගුප්ත අධිරාජ්‍යයේ පිරිහීමට හා බිඳවැටීමට බලපෑ ප්‍රධාන සාධක කවරේද?

ගුප්ත අධිරාජ්‍යයේ පිරිහීමට හා බිඳවැටීමට අභ්‍යන්තර හා බාහිර සාධක හේතු විය.

**අභ්‍යන්තර සාධක**

1. ගුප්ත සමයේ අග භාගයේ දී රාජ්‍යත්වය උදෙසා ඇති වූ අභ්‍යන්තර අරගල

- I වන කුමාරගුප්තගේ මියයෑමෙන් පසු ඔහුගේ පුතුන් අතර සිහසුන වෙනුවෙන් ඇති වූ අරගල.
- මේ හේතුවෙන් අධිරාජ්‍යය කුමාරවරුන් අතර කොටස් වීම.
- භානු ගුප්ත නැගෙනහිර කොටස සහ වෛන්‍ය ගුප්ත, බටහිර කොටස පාලනය කළ බවට සාධක වේ.

2. විශාල අධිරාජ්‍යය පාලනය කිරීමට හා කළමනාකරණය කිරීමට අපොහොසත් වීම.

- ප්‍රාදේශීය පාලකයන් බලවත්ව නැගී ඒම සහ ස්වකීය ප්‍රාන්තවල ස්වාධීනත්වය ප්‍රකාශ කිරීම.
- වලභි මෛත්‍රික, මාල්වාහි යශෝවර්මන්, උච්ච කල්පයෙහි පරිග්‍රාහක ආදී නායකයින් ස්වාධීනත්වය ප්‍රකාශ කිරීම හා ඔවුන් "මහාරාජ" යන විරුදාවලී පවා භාවිතා කිරීම.
- ගුප්ත අධිරාජ්‍යයට ඉතිරි වූයේ මගධය පමණි.

3. ආර්ථික පරිහානිය

- කාසිවල වටිනාකම අඩු වී යාම.

**බාහිර සාධක**

1 නිරන්තර හූණ ආක්‍රමණ මගින් තෝරමාන හා මිහිරකුල ආදී හූණ නායකයින් ඉන්දියානු ප්‍රදේශ අල්ලා ගැනීමට දරූ ප්‍රයත්නය.

- ඔවුන් සින්ධ්, පංජාබ්, මාල්වා, රාජපුතානා යන ප්‍රදේශ දිනා ගැනීම.
- පසුකාලීන දුර්වල පාලකයින්ට හූණ ආක්‍රමණවලට මුහුණදීමට ශක්තියක් නොවීම.

2. ඩෙකෑනයේ වාකාටකවරුන්ගේ ආක්‍රමණ

වාකාටක රාජධානියේ ව්‍යාප්තියත් සමඟ මොවුන් ගුප්තයන්ට අයත්ව තිබූ කෝසල, මෙකලා සහ ගුජරාටිය ආක්‍රමණය කිරීම.

**(ලකුණු 14 යි)**

7."ගුප්තයන්ගෙන් පසු උතුරු ඉන්දියාව ප්‍රමුඛත්වයට පැමිණියේ හර්ෂවර්ධන රාජ්‍ය සමයේදීය."

(i) හර්ෂවර්ධන රාජ්‍ය කාලය පිළිබඳ දක්වෙන සාහිත්‍ය මූලාශ්‍රයන් නම් කරන්න.

- හර්ෂ චරිතය
- හියුංසියැංගේ වර්තාව
- රත්නාවලී
- නාගනන්ද
- ප්‍රියදර්ශිකා

(ලකුණු 01 යි)

(ii) ඔහුගේ රාජ්‍ය සමයේ දී බෞද්ධ සම්මේලන පැවැත්වූ ප්‍රධාන ස්ථාන දෙකක් නම් කරන්න.

- කනෞජය
- ප්‍රයාග / අලහබාද්

(ලකුණු 02 යි)

(iii) ඔහු කනෞජයේ සිංහාසනයට පැමිණි ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

- තානේශ්වරයේ පුෂ්‍යභූති රාජ වංශයේ ප්‍රභාකර වර්ධනගේ පුතුන් දෙදෙනා වූයේ රාජ්‍යවර්ධන හා හර්ෂවර්ධනය. දියණිය රාජ ශ්‍රී දේවියයි.
- කනෞජයේ මෞඛරි වංශයේ ඊශානවර්මන්ගෙන් පසුව අවයන්තිවර්මන් ද ඉන් පසුව ග්‍රහවර්මන් ද බලයට පත් විය.
- ග්‍රහවර්මයට රාජ ශ්‍රී දේවිය විවාහ කර දීමෙන් එම රාජ්‍ය දෙක අතර සබඳතා ඇති විය.
- මාල්වාහි දේවගුප්ත කනෞජයේ ග්‍රහවර්මන් මරා දමා රාජ ශ්‍රී දේවිය පැහැරගෙන ගිය අතර හර්ෂවර්ධන තම නැගණිය බේරා ගැනීමට කටයුතු කිරීම.
- රාජ්‍ය වර්ධන තම සොහොයුරු හර්ෂවර්ධනට කනෞජයේ පාලනය භාර කළේය.
- හර්ෂවර්ධන තම සොහොයුරිය බේරා ගැනීමත් තම සොහොයුරා මැරූ සසංකගෙන් පළි ගැනීමත් සටන් ඇරඹීය.

(ලකුණු 03 යි)

(iv) උතුරු ඉන්දියානු ආධිපත්‍යයේ මධ්‍යස්ථානය බවට කනෞජය පත් කිරීමෙහිලා හර්ෂවර්ධනගේ දායකත්වය සාකච්ඡා කරන්න.

- උතුරු ඉන්දියානු ආධිපත්‍යයේ අවසාන බල මධ්‍යස්ථානය වූයේ කනෞජයයි.
- පුෂ්‍යභූති රාජ වංශයේ සහ මෞඛරි රාජ වංශයේ බල ප්‍රදේශ කනෞජයට යටත් කර ගැනීම.
- මාල්වා ගුජරාට් ප්‍රාදේශ යටත් කර ගැනීම.
- චාලුක්‍ය II පුලකේශිය සමඟ සටන්
- සින්ද් ජය ගැනීම
- ගෞඩ දේශය ආක්‍රමණය
- මෛත්‍රක ශිලා ලිපියට අනුව හර්ෂවර්ධන තම දියණිය වලභි පාලක II ධ්‍රැවසේනට විවාහ කරදීම.
- II පුලකේශින් රජු සමඟ ඇති කර ගත් සටන්. (අයිහෝල් ශිලා ලිපි).
- බෙංගාලයේ සසාංක රජු පරාජය කළ නොහැකි වුවත් සසාංක රජු මිය යෑමෙන් පසුව ක්‍රි.ව. 640 දී බෙංගාලය යටත් කර ගැනීම.
- මහට රාජ යන විරුදය භාවිත කිරීම.
- ඉහත කරුණු අනුව හර්ෂවර්ධන රජු කනෞජයේ බලයට මුළු උතුරු ඉන්දියාවම යටත් කරගෙන ඉන්දියාවේ අවසාන අධිරාජයා බවට පත් වීම.

(ලකුණු 08 යි)

**8. A. ක්‍රි. ව. 7 හා 8 වන ශතවර්ෂවල දී බටහිර හා වයඹ දිග ඉන්දියාවට එල්ල වූ අරාබි ආක්‍රමණ විචාරාත්මකව පරීක්ෂා කරන්න.**

සිරියාව, පලස්තීනය, ඊජිප්තුව වැනි ප්‍රදේශ යටත් කර ගත් අරාබීන් පෙරදිග දෙසට අවධානය යොමු කළ අතර පර්සියාව යටත් කර ගැනීමෙන් පසුව ඉන්දියාව කෙරෙහි අවධානය යොමු කිරීම.

දීර්ඝ කාලයක් ඉන්දියාව සමඟ වාණිජ සබඳතා පැවැත්වූ අරාබීන්ට ඉන්දියාවේ ධනය කොල්ලකෑමේ අවශ්‍යතාවක් පැවති බැවින් මෙම ආක්‍රමණ ඇතිවීම.

ඒ අනුව ක්‍රි.ව. 637 සිට අරාබීන් වරින් වර ඉන්දියාවට ආක්‍රමණ එල්ල කළ බව පෙනේ. ඒ අනුව මුල්ම ආක්‍රමණය බොම්බායේ තානාවටත් දෙවැනිව සින්ධිහි බ්‍රෝච් ප්‍රදේශයටත් තුන්වැන්න සින්දු නදී මුවදොර පිහිටි දෙබාල් ප්‍රදේශයටත් එල්ල කිරීම.
මෙදිනාහි කාලිෆ් යටතේ සිදු වූ මෙම ආක්‍රමණ තුනෙන්ම අරාබීන්ට පරාජය අත් විය. එහි දී ඉන්දියානු ධනය කොල්ලකෑම සහ වාණිජ වාසි ලබා ගැනීම ආගමික අවශ්‍යතාවටත් වඩා ප්‍රමුඛ විය.

ක්‍රි.ව. 700 න් පසුව එල්ල වූ අරාබි ආක්‍රමණ දේශපාලන ස්වරූපයක් දරන බව පිළිගැනේ. අල්හජ්ජාජ් සමයේ දී සින්ධි වෙත එල්ල කළ ආක්‍රමණය උබෙයිදුල්ලා යටතේ සිදුවීම හා ඉන් පරාජය වීම. දෙවැනි ආක්‍රමණයත් මෙපරිද්දෙන්ම පරාජය වීම. එහෙත් මුහමද්බින් කාසිම් යටතේ එල්ල වූ 3 වැනි ආක්‍රමණයෙන් අරාබීන්ට ජය ලබා ගත හැකි වූයේය. ක්‍රි.ව. 712 දී කාසිම් සින්ධි රාජ්‍යය අල්ලා ගැනීමට ද සමත් විය. එමගින් මුල් සින්ධි රාජ්‍යය අරාබි කාලිෆ්වරයාට අවනත රාජ්‍යයක් කර ගැනීමට සමත් විය. අනතුරුව මුල්ටාස් පමණක් නොව කතියවාර් දක්වා ප්‍රදේශ අත්පත් කරගත් මෙම ආක්‍රමණ සාර්ථක වීමට බලපෑවේ යුධ හමුදා අතර ඇති අසමානුකූලවයි. අරාබි හමුදා සංවිධිත වූ අතර ඉන්දිය හමුදා සාම්ප්‍රදායික වූයේය. ඉන්දියානුවෝ හින්දු බෞද්ධ ලෙස භේදභින්න වී සිටියහ. කුලභේදය වැනි සමාජමය කරුණු බලපාන ලදී. ඉන්දියානුවන් යුද්ධයේ ජය පරාජය දෙවියාට භාර දී තිබුණි. රාජධානි අතර අරගල මිස එකමුතු බවක් නොවිය. ඉබන් කාසිම්ගේ මුල්තාන් ජයග්‍රහණය එම සටන් මාලාවේ උච්චස්ථානයයි. ඉන් පසුව කනෞජයට හා කාශ්මීරයට ද ආක්‍රමණයක් එල්ල කළ නමුත් ඊවායින් පරාජයට පත් විය.

මින් පසුව II උමාර් කාලිෆ් යටතේ ක්‍රි.ව. 717-720 අතර කාලයේ දී ආක්‍රමණ එල්ල කළ බව කියැවුනත් එම ස්ථාන නිවැරදිව හඳුනා ගැනීම අසීරුය.
ඉන් පසුව කම්ම් විසින් සින්ධි ප්‍රදේශයේ අරාබි බලය තහවුරු කිරීම පිණිස අල්මහෆූස් හා මන්සුරාහි නමින් මධ්‍යස්ථාන 2 ක් පිහිටුවීය. එහෙත් ඉන් පසුව අරාබීයේ බලය සින්ධි ප්‍රදේශයේ දී දුර්වල වූ බව පෙනේ.

මේ අනුව අරාබිවරු සියවස් 3 ක් පමණ සින්ද් ප්‍රදේශයේ බලයේ සිටි නමුත් ඔවුනට ඉන්දු නිම්නයෙන් ඔබ්බට ඉන්දියාව තුළ බලය පැතිරවීමට නොහැකි විය. ඔවුන් අප්‍රිකා හා ආසියාවේ අනික් ප්‍රදේශවල ලැබූ ජය සමඟ සසඳන විට සින්ධුවල ලැබූ ජය ඉතා සීමා සහිතය. I නාගභට, පුලකේශින්, ධර්මපාල යශෝවර්මන් වැනි ඉන්දියානු පාලකයින් අරාබීන්ට විරුද්ධව සටන් කොට ඔවුන් පරාජය කිරීම මීට හේතු විය. මෙම ආක්‍රමණ හේතුකොටගෙන ඉන්දියානු ධනය හා ශාස්ත්‍රීය දැනුම අරාබිකරයට ඇදී ගිය අතර අරාබිවරුන්ගේ දැනුම ඉන්දිය ප්‍රදේශ වල ව්‍යාප්ත විය. ඉස්ලාම් ධර්මය එම ප්‍රදේශවල ව්‍යාප්ත විය.

(ලකුණු 14 යි)

**B. I රාජරාජ හා I රාජේන්ද්‍ර යටතේ චෝල බල ව්‍යාප්තියේ ප්‍රධාන අවස්ථා වෙනහැර දක්වන්න.**

- දක්ෂිණ පථයේ ආධිපත්‍යය උදෙසා රාෂ්ට්‍රකූට හා පල්ලව වැනි රාජ්‍ය සමඟ අරගලයක නිරතව සිටි (ක්‍රිෂ්ණ සමඟ ක්‍රි.ව. 949 කරන ලද තක්කෝලම් සමරින් චෝළ රාජ්‍යය සතු විශාල ප්‍රදේශයක් අහිමි වීම) චෝලයන් අධිරාජ්‍යයකට පදනම් දමන ලද්දේ I රාජරාජ සමයේ දීය.

**I රාජරාජ**

- චෝළ ආධිපත්‍යයේ වර්ධනය සඳහා වන I රාජරාජ අනුගමනය කළ ක්‍රියාමාර්ග
  - චෝළ නාවික බලය වර්ධනය කිරීම. එහි දී එවකට දකුණේ බලවත් වූ චේර (කේරල) නාවික හමුදාව කන්දලූර් (ත්‍රිවේන්ද්‍රම්) හිදී විනාශ කර දමන ලදී.

  - අසල්වැසි රාජ්‍ය විසින් චෝළ ආධිපත්‍යය පිළිගනු ලැබීම.
    - මදුරා නගරය අල්ලාගෙන පාණ්ඩ්‍ය රජු සිරභාරයට ගැනීම
    - කේරළ හා පාණ්ඩ්‍ය බලය වර්ධනය වීම වැලැක්වීමට උදගායි (කූර්ග්) ආක්‍රමණය කොට යටත් කිරීම.
    - ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශ අල්ලාගෙන V මහින්ද රජු සිරභාරයට ගැනීම.
    - සිහසුන පිළිබඳ අරගලයක් පැවති නැගෙනහිර චාලුක්‍ය අගනුවර (වෙංගි) අල්ලාගෙන, තම ආධිපත්‍යය පිළිගත් ශක්තිවර්මන් එහි රජ කරවීම. ශක්තිවර්මන්ගේ සොහොයුරු විමලාදිත්‍යයට තම දියණිය සරණ පාවාදීම.
    - නැගෙනහිර චාලුක්‍යයන්ට ද තර්ජනයක් වූ කාලිංග අල්ලා ගැනීම.
    - ලක්දිව හා මාලදිවයින් අල්ලා ගැනීම.
    - මයිසූරයේ ප්‍රදේශ කිහිපයක් අල්ලා ගැනීම නිසා බටහිර චාලුක්‍යයන් සමඟ ගැටුනද ඔවුන්ට ජයගත නොහැකි වීම.

**රාජේන්ද්‍ර චෝළ**

- රාජේන්ද්‍ර විසින් චෝළ ආධිපත්‍යය තව දුරටත් ව්‍යාප්ත කිරීම.
  - තුංගභද්‍රා නදියෙන් ඔබ්බට හමුදා මෙහෙයවමින් බෙංගාලයේ ගංගා නදිය දක්වා ජයග්‍රාහී ලෙස සටන් මෙහෙයවූ නමුත් එම ප්‍රදේශ තම රාජ්‍යයට ඈඳා නොගැනීම.
  - ශ්‍රී ලංකාවේ විශාල ප්‍රදේශයක් නතු කර ගැනීම. V මහින්ද සිරභාරයට ගැනීම. පොළොන්නරුව මුල් කර ගත් මුම්මුඩිචෝලමණ්ඩලම් තවත් ප්‍රාන්තයක් ලෙස පවත්වා ගැනීම.
  - පාණ්ඩ්‍ය හා කේරල ප්‍රදේශවල ප්‍රතිරාජ ලෙස තම පුතු පත් කිරීම.

- ඉන්දියානු සාගරයේ සහ චීනය දක්වා වෙළඳ කටයුතු පාලනය කිරීමේ අදහසින් ඒ දිශාවට කළ ආක්‍රමණ හා ඒ ප්‍රදේශය සමඟ පැවැත්වූ සම්බන්ධතා.
  - චීනය , බුරුමය හා මලය අර්ධද්වීපය සමඟ සබඳතා.
  - පූගදු සබඳතා.
  - අග්නිදිග ආසියාව දෙසට ආක්‍රමණය මෙහෙයවීම නිකොබාර් හා අන්දමන් දූපත් අල්ලා ගැනීම. ශ්‍රී විජය රාජ්‍යය (ජාවා, සුමාත්‍රා, මලය අර්ධද්වීපය)
  - මේ මගින් ඉන්දියන් සාගරයේ හා අග්නිදිග ආසියාකරයේ වෙළඳාම පාලනය කිරීමට චෝලයෝ සමත් වූහ.

(ලකුණු 14 යි)

9. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ සටහන් ලියන්න.

**I. සෙලියුකස් නිකේටර්**

- මෞර්ය අධිරාජ්‍යයේ චන්ද්‍රගුප්ත මෞර්ය රජු පාලනය කරන කාලයේ වයඹදිග ප්‍රදේශයේ විදේශ ආධිපත්‍යය පැවතුණි. ඇලෙක්සැන්ඩර් අධිරාජයාගේ ආධිපත්‍යය යටතේ පැවති මේ ප්‍රදේශවල සිටි ප්‍රාදේශීය පාලකයන් අතර ද ගැටුම් ඇති විය. මේ ගැටුම් අවසන් කරමින් පාලන කටයුතු ගෙන ගිය ග්‍රීක පාලකයකු ලෙස සෙලියුකස් නිකේටර් හැඳින්වීම. ජස්ටින්ගේ වාර්තාවල තොරතුරු සඳහන් වීම.
- ඉන්දියාවේ සින්දු නදී ප්‍රදේශයෙන් නැගෙනහිර පැවති රාජ්‍යවල ද බලය ලබා ගැනීමට තම්ද පාලන සමය තුළ දී ද ග්‍රීක පාලකයන්ට අවශ්‍ය වීම.
- එම ප්‍රදේශ මගධ අධිරාජ්‍යයට අයත්වීම නිසා සෙලියුකස් නිකේටර්ට එම අරමුණ ඉටු කර ගැනීමට නොහැකි වීම. ඉන්දිය ප්‍රදේශ ග්‍රීක පාලනයෙන් ගිලිහී යාම නිසා ක්‍රි.පූ. 305 දී සෙලියුකස් නිකේටර් ඉන්දියාව ආක්‍රමණය කිරීම. සින්දු නදියේ බටහිර ප්‍රදේශ වල සෙලියුකස් නිකේටර්ගේ හමුදා බලය ප්‍රබලව පැවති නිසා චන්ද්‍රගුප්ත මෞර්ය රජු සටනට නොගොස් දිග්විජය ව්‍යාපාරය ටික කලකට නතර කිරීම.
- පසුව මධ්‍ය ඉන්දිය ප්‍රදේශ ජය ගැනීමෙන් පසු සින්දු නදියේ ප්‍රදේශ පාලනය කළ සෙලියුකස් නිකේටර් සමඟ මෞර්ය චන්ද්‍රගුප්ත රජු සටන් කිරීම.
- මෞර්ය චන්ද්‍රගුප්ත රජු සමඟ සෙලියුකස් නිකේටර් අතර ඇති වූ සටනින් සෙලියුකස් නිකේටර් පරාජයට පත්වීම.
- සෙලියුකස් නිකේටර්ට අයත් සියලු බල ප්‍රදේශ මෞර්ය චන්ද්‍රගුප්ත රජුට ලැබීම.

<u>දෙදෙනා අතර ඇතිකරගත් ගිවිසුමේ සඳහන් ප්‍රධාන ප්‍රකාශ</u>

ඒරියා (හිරාත්) ඇරකෝෂියා (කන්දහාර්) ගෙඩරෝෂියා (කාබුල්) පරපනිසදෙයි (බලුකිස්ථානය) යන ප්‍රදේශ චන්ද්‍රගුප්ත මෞර්යට ලබාදීම.

- සෙලියුකස්ගේ දියණිය හා පුහුණු කරන ලද ඇතුන් 5 දෙනෙකු ලබා දීම.
- තානාපතියකු ලෙස මෙගස්තිනිස් මෞර්ය චන්ද්‍රගුප්ත රජුගේ රාජ සභාවට ලබා දීම.
- යුධමය වශයෙන් පුහුණු කරන ලද ඇතුන් 500 ක් ලබා දීම.
- මේ නිසා සෙලියුකස් නිකේටර්ගේ ඉන්දිය ප්‍රදේශ අල්ලා ගැනීමේ සිහිනය අවසන් වීම.

(ලකුණු 07 යි)

II. ගණ රාජ්‍යය

ක්‍රි.පූ. 6 සියවසේ උතුරු ඉන්දියාවේ ගොඩනැගී තිබූ සොළොස් මහා ජනපදවල ක්‍රියාත්මක වූ පාලන තන්ත්‍ර දෙකෙන් එකකි.

- ගණ රාජ්‍යය හෙවත් සමූහාණ්ඩු පාලන ක්‍රමය.
- මේ රාජ්‍ය පිළිබඳ බොහෝ තොරතුරු බෞද්ධ, ජෛන හා හින්දු සාහිත්‍යයේ දක්වේ.
- වජ්ජි හා මල්ල මෙකල පැවති ප්‍රධාන ගණ රාජ්‍ය දෙක වේ.
- මීට අමතරව බෞද්ධ සාහිත්‍යයේ ගණ රාජ්‍ය 9 ක් ගැන සඳහන් වේ. කපිල වස්තුවේ ශාක්‍යයෝ, කුසිනාරාවේ හා පාවා නුවර මල්ලයෝ, වෛශාලියේ ලිච්ඡවීන්, මිථිලාවේ විදේහයන්, රාමගාමයේ කෝලියන්, අල්ලකප්පයේ බුලියන්, කේසපුත්තයේ කාලාමයන්, පිප්පලිවනයේ මෝරියන්, සුංසුමාරගිරයේ භග්ගයන්.
- මේ රාජ්‍යවල පාලකයෝ බොහෝ ගණනක් වූහ. මොවුන් රාජා, ගණපති, ගණ ජ්‍යෙෂ්ඨ, ගණරාජන්, ගණදෙටු යන නම්වලින් හැඳින්විණි.
- ක්‍රි.පූ. 6 වන සියවසේ ලිච්ඡවි රාජ්‍යයේ රජවරුන් 7707 ක් සිටි බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ.
- නියෝජිතයන්ගෙන් සැදුණු විධායක සභා මගින් මේ රාජ්‍යවල පාලනය ගෙන යන ලදී.
- මොවාගේ පාලකයන් සප්ත අපරිහානීය ධර්ම අනුගමනය කිරීම සුවිශේෂී ලක්ෂණයකි.

(ලකුණු 07 යි)

III. සංගම් සාහිත්‍යය

- ක්‍රි.ව. 1 සියවසේ සිට ක්‍රි.ව. 3 වන සියවස දක්වා පාණ්ඩ්‍ය රජවරුන්ගේ අනුග්‍රහය යටතේ සංගම් කෘති ලිවීම ආරම්භ විය.
- රජ අනුග්‍රහය යටතේ පළමු සංගමය මදුරාවේ දකුණේ ද දෙවැනි සංගමය කබාඩපුරම්හි ද, තුන්වැන්න මදුරාවේ ද පැවැත්විණි.
- පසුව චෝළ රජවරුන්ගේ අනුග්‍රහය යටතේ සංගම් කෘතීන් රැසක් ලියවිණි.
- සංගම් සාහිත්‍යය, උපදේශාත්මක හා වෘත්තාන්තමය යනුවෙන් දෙවර්ගයකි.
- උපදේශාත්මක කාව්‍ය, කීල්කනක්කු ලෙස ද වෘත්තාන්තමය ග්‍රන්ථ, මේල්කනක්කු ලෙස ද හැඳින්වේ.
- තොල්කාප්පියම් යනු ද්‍රවිඩ ව්‍යාකරණ ග්‍රන්ථයකි.
- තිරුක්කුරල්, සිලප්පදිකාරම්, මණිමේකලෛ වැදගත් සංගම් කෘති කිහිපයකි.
- දකුණු ඉන්දියානු ඉතිහාසය අධ්‍යයනය කිරීමට ඇති වැදගත්ම මූලාශ්‍රයකි.
- චේර, පාණ්ඩ්‍ය, චෝළ පාලකයින්ගේ දේශපාලන තොරතුරු මෙන්ම, ආර්ථික තොරතුරු හා සමාජ සංස්කෘතික තොරතුරු හෙළි වේ.
- සංගම් යුගයේ සිටි කවීන් අතර අගස්තියර්, මුඩිනාගරායර්, තොල්කාප්පියර්, කපිලර් වැදගත් වේ.

(ලකුණු 07 යි)

## IV වයඹදිග ඉන්දියාවේ ශක පාලනය

- මධ්‍ය ආසියාතික ගෝත්‍රයක් ලෙස සැලකෙන ශකවරුන් ක්‍රි.පූ. 2 සහ 1 සියවස්වල ඉන්දු-ග්‍රීකයන් යටතේ පැවැති උතුරු, වයඹදිග හා බටහිර ඉන්දිය ප්‍රදේශ අත්පත් කරගත් බවට සාක්ෂි හමුවේ.
- ස්ටෙප්ස් තෘණභූමි ආශ්‍රිතයේ සිටි ශකවරුන් චීන හා මධ්‍ය ආසියාවේ සීමාවල සිටි ගෝත්‍රිකයන්ගේ බලපෑම් නිසා සංක්‍රමණය වීම.
- චීන හා ග්‍රීක, රෝම වාර්තාවලින් ද සෙල්ලිපි හා කාසිවලින් ද මේ පිළිබඳ තොරතුරු ලැබේ.
- ඔවුන් පර්සියාවේ බැක්ට්‍රියාවේ පදිංචිවීම.
- බැක්ට්‍රියන් ග්‍රීකවරු පලවාහැර එම ප්‍රදේශවල බලය පැතිරවීමට ශකවරු සමත් විය.
- ඉන්දියාවට පැමිණි ශකවරුන්ගේ කාසි මුලින්ම ලැබී තිබෙන්නේ ඇරකෝෂියා ගෙඩරෝසියා හා පංජාබ් යන ප්‍රදේශවලිනි.
- මොවුන් බෝලාන් කපොල්ල ඔස්සේ ඉන්දියාවට පැමිණි බව සඳහන් වේ.
- ශකවරුන්ගේ පෙළපත් කිහිපයක් උතුරු හා වයඹදිග ඉන්දියාව පාලනය කළ බව කරෝෂ්ඨි ලිපි සෙල්ලිපිවල සඳහන් වේ.
- ශකවරු ශත්‍රප නම් ඒකකවලට බෙදා ප්‍රදේශ පාලනය කරන ලදී.
- තක්ෂිලාව මුල් කරගෙන පාලනය කළ මුල්ම ශක පාලකයා  මාවුස් රජුය. (ක්‍රි.ව. 20-32).
- තක්ෂිලාවෙන් හමු වූ ලිපියක බුදුන් වහන්සේගේ ධාතු ස්ථූපයක තැන්පත් කළ බව සඳහන් වේ.
- කාසිවල සඳහන් වන පරිදි මහාරාජාධිරාජ යන විරුදය භාවිත කිරීම.
- සිය අණසක පළමුව පංජාබයේ ද පසුව ගන්ධාර මථුරාවද දක්වා පැතිර වීම.
- කාර්දමක පෙළපතේ ශ්‍රේෂ්ඨතම රජු ලෙස සැලකෙන මහාශත්‍රප රුද්‍රදාමන් රජුය.
- ඔහු සාතවාහන රජු පරාජය කළ බව ජූනාගාද් ලිපියේ සඳහන් වේ.
- ජූනාගාද් ලිපියට අනුව රුද්‍රදාමන්ට කතියවාර්, මාල්වා, ගුජරාට් හා උතුරු කොන්කණය සින්ධු නිම්නයට අයත්ව තිබුණු බව.

(ලකුණු 07 යි)

******